# දෙවන වාර පරීක්ෂණය - 2019

| නර්තනය II | 13 ශ්‍රේණිය |
|---|---|
| නම / විභාග අංකය :- ........................................................................<br>පන්තිය :- ............................ | පැය 03 යි. |

- පළමුවන කොටසේ ප්‍රශ්න අංක 01 හා 02 අනිවාර්ය වේ.
- I හා II කොටස් වලින් එක් ප්‍රශ්නය බැගින් ඇතුළත් වන සේ තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකම I කොටසට ලකුණු 06 ක් ද II කොටසට ලකුණු 06 ක්ද III කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස (ප්‍රස්ථාර හා ඓතිහාසික පසුබිම)

01. (i) මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් වන්නමක හෝ සිංදු වන්නමක බෙර පදය සහ කවි පද දෙකක් ප්‍රස්ථාර කරන්න.

(ii) පහත සඳහන් කවි පද දෙක මාත්‍රා 3 තාල රූපයට ප්‍රස්ථාර කරන්න.

"උඩින් උඩින් උඩු ගුවනින් ගෙනාවා - බිමින් බිමින් බිම්තැන්නෙන් ගෙනවා"

(iii) දොං ජිංත ගත දොංත වට්ටමේ අඩව්වක් හෝ ගුද ගති ගත වට්ටමේ සුරලක් හෝ යාදිනි මාත්‍රයේ අඩව්ව හෝ ප්‍රස්ථාර කරන්න.

02. ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු ලිඛිත හා පුරා විද්‍යාත්මක සාධක ඔස්සේ විමසා බැලීම වැදගත් වේ.

(i) වංශකතා ඇසුරින් අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ සාධක දෙකක් ඉදිරිපත් කරන්න.

(ii) දේශාටන වාර්තා ඇසුරින් සාධක දෙකක් දක්වන්න.

(iii) ක්‍රි.ව. 1930 – 1960 දක්වා දේශීය නර්තනයේ ප්‍රවර්ධනයට බලපෑ සාධක හතරක් දක්වන්න.

## II කොටස (ශාන්තිකර්ම ක්ෂේත්‍රය හා ජන නැටුම් හා ජනනාටක)

03. දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම වූ කලී සමාජ සාරධර්ම හා ආකල්ප මත බැඳී පවතින්නකි.

(i) සන්නියකුම ශාන්තිකර්මයේ පුරාවෘත කතා මගින් හෙළිවන සමාජ සාරධර්ම පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) කොහොඹාකංකාරියේ එන ඌරා යක්කමෙන් කුල භේදය පිළිබඳ ඉඟියක් ලැබෙයි. විමසීමක් කරන්න.

(iii) වලියක් මංගල්‍යයේ එන සැරසිලි වල දක්නට ලැබෙන විශේෂතා පිළිබඳ ඇගයීමක් කරන්න.

04. අභිනය යන සංකල්පයට සෑම ශාන්තිකර්මයකදීම විශේෂත්වයක් හිමි වේ.

(i) බලි ශාන්තිකර්මයේ ඇති සෞන්දර්යාත්මක වටිනාකම ආහාර්ය අභිනය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(ii) ප්‍රකාශනය තීව්‍ර කිරීම සඳහා රංග වස්ත්‍රාභරණ යොදාගෙන ඇති ආකාරය සන්නියකුම ඇසුරෙන් විමසීමක් කරන්න.

(iii) කිරිමඩු ශාන්තිකර්මයේ එන සැරසිලි පිළිබඳ ඇගයීමක් කරන්න.

05. සමාජය විවරණය කිරීම ගැමි නැටුම් හා ගැමි නාටක මගින් සිදු වේ.

(i) ගැමි නැටුමෙන් විවරණය කෙරෙන ගැමි ජීවන රටාව හා ආගමික පසුබිම පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ii) ගැමි නැටුම් හා ගැමි නාටක අතර ඇති වෙනස්කම් පෙන්වා දෙන්න.

(iii) කෝලම් චරිත දෙකක් තෝරාගෙන ඒ ඇසුරින් සමාජ විවරණය පිළිබඳ විචාරයක් කරන්න.

# III කොටස (විදේශීය නර්තන හා රස වින්දන)

06. පහත සඳහන් වගුවෙහි (අ) (ආ) (ඉ) යන කොටස් වලට අදාළව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| අ | | ආ | | ඉ | |
|---|---|---|---|---|---|
| පරන් | රාස්ලීලා | වෙණ්ඩා | සාරංගි | හංසවිල, | අවුරොරො කුමාරයා |
| ථුම්රි | පදම් | චෙන්ගිලම්<br>පඛ්වාජ් | | නට්ක්‍රැකර් | බැරිසිල් |
| තරානා | තිල්ලානා | ඉලතාලම් | තබ්ලා | නිදිකුමරිය | ගිසෙල්ලි |

(i) (අ) කොටසින් මනිපුරි නර්තන සම්ප්‍රදායට අදාළ නර්තන අංගය තෝරා එහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

(ii) (ආ) කොටසින් කථකලි නර්තන සම්ප්‍රදායට අයත් අවනද්ධ භාණ්ඩය තෝරා ඒ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(iii) (ඉ) කොටසින් දේශීය මුද්‍රා නාට්‍යක් නම් කර එහි සංගීතය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ ඇගයීමක් කරන්න.

07. දේශීය නර්තන නිර්මාණකරණයට පෙර අපර දෙදිග නවීන තාක්ෂණය හා ක්‍රම ශිල්ප බල පා ඇති බව පෙනේ.

(i) නර්තන සංචලන කෙරෙහි පෙර අපර දෙදිග බලපෑම පිළිබඳ විමසීමක් කරන්න.

(ii) රූපවාහිනී නර්තන වැඩ සටහන් සඳහා නූතන තාක්ෂනික ක්‍රම ශිල්ප ක්‍රම යොදාගෙන ඇති ආකාරය පිළිබඳව විමසීමක් කරන්න.

(iii) පාසල් දරුවන් රියලිටි වැඩ සටහන් වලට සහභාගි වීම නර්තනයේ ප්‍රවර්ධනයට හේතුවක් වේද ?

08. අනුෂාංගික කලා භාවිතය අද්‍යතන ප්‍රාසාංගික නර්තන නිර්මාණයේදී වැඩි වශයෙන් දක්නට ලැබේ.

(i) වේදිකා ආලෝකකරණයේදී භාවිත වන විදුලි පහන් වර්ග පිළිබඳ සාකච්ඡා කරන්න.

(ii) රංග වස්ත්‍ර නිර්මාණය පිළිබඳ අදහස් දක්වන්න.

(iii) නූතන රංගභූමි අලංකරණයේදී භාවිත විවිධ ශිල්ප ක්‍රම පිළිබඳව ඇගයීමක් කරන්න.